ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2020 මාර්තු 03 යොමු අංකය: 1920-039

දයාබර දෙමාපියන් වෙත,

<u>**දහම් පාසල නිවාඩු දීම පිළිබඳව දැන්වීමයි**</u>

දැනට ලෝකයේ බොහෝ රටවල් වල සහ මෙම රටේ පවතින කොරෝනා වෛරසය පැතිර යාමේ තර්ජනය හේතුවෙන්, අප කොන්සල් ජනරාල් කාර්යාලයේ උපදෙස් මත සහ මෙම රජය විසින් ප්‍රකාශයට පත් කල පරිදි 2020 මාර්තු 06 වැනිදා සිට නැවත දැනුම් දෙන තුරු දහම් පාසල නොපැවැත්වීමට තීරණය කොට ඇත.

මෙම කාලය තුල පුණරීක්ෂණ පාඩම් දහම් පාසලේ විද්‍යුත් තැපැල මගින් ඔබවෙත එවීමට කටයුතු සූදානම් වෙමින් පවතින බවද දන්වා සිටිමු.

මෙම කාලය තුළ අපගේ දරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් රජය විසින් දෙන උපදෙස් අනුගමනය කොට සෞඛ්‍ය සම්පන්නවීමට කල්පනාකාරී වනු ඇතැයි අපගේ විශ්වාසයයි.

මේ පවතින තත්වය ඉතා ඉක්මනින් සමනය වී මුළු ලෝ වැසියන්ට යහපතක් වේවායි පතා පවුලේ සියලු දෙනාම එක්ව දිනපතා නිවෙස්වල බුද්ධ වන්දනා කටයුතු සිදුකිරීම, තුන් සූත්‍රය, බන්ධ සූත්‍රය, බෝජ්ජංග පිරිත ආදී පිරිත් සජ්ජායනා කිරීම, මෛත්‍රී භාවනාවෙහි යෙදීම වැනි ආගමානුකූල කටයුතුවල නිරත වන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

තෙරුවන් සරණයි!

සංවිධායක මණ්ඩලය, ඩුබායි දහම් පාසල

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org